00025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩ සටහන - හයවන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESU 4301- නව යෞවනයන් පිළිබඳ මනෝ විද්‍යාව

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.03.04 වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. නව යොවුන්වියේ මානසික අවශ්‍යතා දෙකක් (02) ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ පවුල්වල දෙමාපිය- යෞවන ගැටුම්වලට හේතු තුනක් (03) සඳහන් කරන්න.

03. යෞවන වියේ අත්දකින තිරණාත්මක වෙනස්කම් දෙකක් (02) නම් කොට, ඒවා සුසාධ්‍ය කිරීමට පන්තිභාර ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න.

04. නව යෞවනයන් තුල ඇති චිත්තවේගිය ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න.

05. නව යෞවනයන්ගේ අභිරුචි ආශ්‍රිත ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න.

06. නව යොවුන්විය සුවිශේෂ අධ්‍යයනයක් අවශ්‍ය කාල පරිච්ඡේදයක් ලෙස සැලකීමට හේතු තුනක් (03) ක් දක්වන්න.

07. වියුක්ත චින්තන අවධියෙහි කැපී පෙනෙන ඉහළ ප්‍රජානන හැකියා දෙකක් (02) නිදසුන් දක්වමින් කෙටියෙන් විස්තර කරන්න.

08. සමායෝගී වූ පුද්ගලයෙකු සතු ලක්ෂණ හතරක් (04)දක්වන්න.

( ලකුණු 5 x8 = 40 )

## II වන කොටස

09. i. තෝරාගත් ඕනෑම න්‍යායකට අනුව පුද්ගලයෙකුගේ පෞරුෂය සංවර්ධනය වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

ii. පෞරුෂය කෙරෙහි බලපාන සාධක 4 ක් උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 08)

iii. නව යෞවනයන්ගේ පෞරුෂ සංවර්ධනය සුසාධ්‍යකරණය සඳහා දෙමාපියන්ගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 06)
( මුළුලකුණු 20)

10. නව යෞවනයන් තුළ අධ්‍යාපනික දියුණුවට අදාළ අභිරුචි වර්ධනය ගුරුවරයා විසින් දිරිගැන්විය යුතු ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

11. i. යෞවනයන් අවදානම් භාර ගැනීමට කැමතිය. අවදානම් භාරගැනීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ යෞවනයන්ගේ ආකල්ප හැඩ ගැස්වීමේදී මාධ්‍යයෙහි බලපෑම විස්තර කරන්න.
(ලකුණු 10)

ii. යෞවනයන්ගේ ස්ව සංකල්පය සංවර්ධනය කිරීම සඳහා සමවයස් කණ්ඩායම්වල දායකත්වය ගුරුවරයකු ලබා ගත යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 20)

12. පහත දැක්වෙන ඕනෑම හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

a) නව යෞවන - දෙමව්පිය ගැටුම්වලට හේතු
b) යෞවනයන්ගේ සමාජ අවශ්‍යතා
c) ශ්‍රී ලංකාව තුල පවතින තරුණ අසහනයට හේතු
d) නව යෞවනයන්ගේ පොදු වූ චිත්තවේගී රටා
e) නව යෞවන වියේ ශාරීරික වෙනස්වීම් නිසා ඇතිවන ප්‍රතිඵල
f) නව යෞවනයන්ගේ ආත්ම-කේන්ද්‍රිය බව

(ලකුණු 4x5 = 20)

13. i. චිත්තවේග අර්ථ දක්වා නව යෞවනයන්ගේ චිත්තවේගී සංවර්ධනය අධ්‍යයනය කළ යුත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. චිත්තවේග මගින් යෞවනයන්ගේ චර්යා පාලනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iv. යෞවනයන්ගේ චිත්තවේගිය සංවර්ධනයට අදාළව ගුරු භූමිකාව සාකච්ඡා කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

14. i. නව යෞවනයන් තුළ කැපී පෙනෙන සමාජ අවශ්‍යතා හතරක් (4) පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. තෘප්තිමත් නොවූ සමාජ අවශ්‍යතාවයන් නව යෞවනයන්ගේ හැසිරීම් කෙරෙහි බලපෑ හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

iii. එම හැසිරීම් නිසා පැන නඟින ගැටළුවලට විසඳුම් සොයා ගැනීම සඳහා ගුරුවරුන් උපකාර විය යුත්තේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF EDUCATION DEGREE PROGRAMME**
**(NATURAL SCIENCE)**
**FINAL EXAMINATIONS – 2013**
**ESU4301 – PSYCHOLOGY OF THE ADOLESCENT**
**DURATION – THREE (03) HOURS.**

Date: 04th March 2013 Time: 1.30 p.m. 4.30 p.m.

**Answer all questions in Part I & three (03) questions from Part II.**

## PART I

01. Explain two (02) Psychological needs in the Adolescence.

02. State three (03) reasons that cause parent – adolescent conflicts in Sri Lankan families.

03. Name two (02) crucial changes experiencing in the adolescence and briefly explain the role of the class teacher in facilitating those changes.

04. Briefly describe the nature of emotions in adolescents.

05. State three (03) characteristics of adolescent interests.

06. State three reasons to explain why adolescence, to be considered as a period requiring special study.

07. Briefly describe two (02) higher order cognitive skills that are prominent in the formal operational stage.

08. State four (04) characteristics of a well adjusted person.

(5 x 8 = 40 marks)

## PART II

09. i. Discuss in line with any selected theory how the development of personality takes place in an individual.

(06 marks)

ii. Briefly describe with examples four (04) factors that affect personality.

(08 marks)

iii. Explain the role of parents in facilitating the personality development of adolescents.

(06 marks)
(Total 20 marks)

10. Discuss how the teachers should encourage the development of interests relevant to academic pursuits in adolescents.

(20 marks)

11. i. Explain the impact of media on moulding attitudes of Sri Lankan adolescents to refrain from taking risks.

(10 marks)

ii. Explain how a teacher should get contribution of peers in developing the self-concept in adolescents.

(10 marks)
(Total 20 marks)

12. Write short notes on any four (04) of the following.
    i. Reasons for the conflicts between adolescents and parents.
    ii. Social needs of adolescents.
    iii. Reasons for youth unrest in Sri Lanka.
    iii. Common emotional patterns of adolescents.
    iv. Implication of bodily changes in adolescence.
    v. Ego-centrism of adolescents.

(4 x 5 = 20 marks)

13. i. Define 'emotions' and explain how the emotional development of adolescents should be studied.

(08 marks)

ii. Describe how emotions would control the behaviour of adolescents.

(06 marks)

iii. Discuss the role of the teacher in line with the development of emotions of adolescents.

(06 marks)

(Total = 20 marks)

14. i. Explain four (04) social needs that are prominent among adolescents.

(04 marks)

ii. Describe how the unsatisfactory social needs affect the behaviour of adolescents.

(08 marks)

iii. Discuss how the teachers should help to find solutions for the problems that would arise due to above mentioned behaviours.

(08 marks)

(Total 20 marks)

*- Copyrights reserved -*